# කුසලයෙහි ආනිසංස සහ ප්‍රමාණ
## වේලාම සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 5 - පිටු අංක 434 - 439)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන කල්හි, අනේපිඬු සිටුතුමා පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පස් ව ඉඳගත්තේය.

“ගෘහපතිය, ඔබගේ නිවසේ දන් දෙනවාද?” යැයි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

“එසේය ස්වාමීනි, ඒ ද රූක්ෂ කාඩි (ඇඹුල් රසින් යුතු කුළු බඩු ආදිය යොදා සාදා ගන්නා මිරිස් හොද්දක්) දෙවෙනි කොට ඇති කුඩු හාලේ බත්ය”.

“ගෘහපතිය, ප්‍රණීත හෝ ප්‍රණීත නොවන දෙයක් දන් දේ ද,

- එය මනා ව සකස් නොකොට දේ නම්,
- අගෞරවයෙන් දේ නම්,
- තම අතින් ම නොදේ නම්,
- ඉවත දමන දෙයක් සේ දේ නම්,
- කර්ම සහ විපාක නොදැන දේ නම්,

යම් යම් තැනක ඒ දානයාගේ විපාකය ලැබේ ද, එහෙත් ඒ,

- ප්‍රණීත ආහාර අනුභවයට ඔහුගේ සිත නොනැමෙයි.
- වටිනා ඇඳුම් ඇඳීමට ඔහුගේ සිත නොනැමෙයි.
- වටිනා යාන වාහන භාවිතයට ඔහුගේ සිත නොනැමෙයි.
- ප්‍රිය වූ රූප, ශබ්ද, ගන්ධ, රස හා පහස විඳීමට ඔහුගේ සිත නොනැමෙයි.
- අඹු දරුවෝ හා සේවක සේවිකාවෝ ඔහුගේ වචනයට අවනත නොවෙති. කන් යොමු නොකරති. ඔහු පවසන දේ තේරුම් නොගනිති.

එයට හේතුව ගෘහපතිය, මේවා සකස් නොකොට කළ කර්මයන්ගේ විපාක වන බැවිනි.

එසේ ම ගෘහපතිය, ප්‍රණීත හෝ ප්‍රණීත නොවන දෙයක් දන් දේ නම්,

- මනා ව සකස් කොට දේ ද,
- ගෞරවයෙන් දේ ද,
- තම අතින් ම දේ ද,
- ඉවත දමන දෙයක් සේ නොදේ ද,
- කර්ම සහ විපාක දැන දේ ද,

යම් යම් තැනක ඒ දානයාගේ විපාක ලැබේ නම් ඒ,

- ප්‍රණීත ආහාර අනුභවයට ඔහුගේ සිත නැමෙයි.
- වටිනා ඇඳුම් ඇඳීමට ඔහුගේ සිත නැමෙයි.
- වටිනා යාන වාහන භාවිතයට ඔහුගේ සිත නැමෙයි.
- ප්‍රිය වූ රූප, ශබ්ද, ගන්ධ, රස හා පහස විඳීමට ඔහුගේ සිත නැමෙයි.
- අඹු දරුවෝ හා සේවක සේවිකාවෝ ඔහුගේ වචනයට අවනත වෙති. කන් යොමු කරති. ඔහු පවසන දේ තේරුම් ගනිති.

එයට හේතුව ගෘහපතිය මේවා සකස් කොට කළ කර්මයන්ගේ විපාක වන බැවිනි.

ගෘහපතිය, අතීතයේ වේලාම නම් බමුණෙක් විය. ඔහු ‘මහා දානය’ නම් වූ මෙබඳු දානයක් දුන්නේය.

- රිදී පිරවූ රන් බඳුන් අසූහාරදාහක්,
- රන් පිරවූ රිදී බඳුන් අසූහාරදාහක්,
- අමු රන් පිරවූ රන් තැටි අසූහාරදාහක්,
- රනින් කළ සැරසිලි ඇති, රන් කොඩි ඇති, රනින් කළ දැල් ඇති ඇතුන් අසූහාරදාහක්,

- සිංහ සම් ඇතිරූ, ව්‍යාඝ්‍ර සම් ඇතිරූ, දිවි සම් ඇතිරූ, කම්බිලි ඇතිරූ, රනින් සැරසූ රන් කොඩි ඇති, රන් දැල් සහිත යානා (වාහන) අසූහාරදාහක්,
- මැණික් ඇල්ලූ කුණ්ඩලාභරණයෙන් සැරසූ කන්‍යාවන් අසූහාරදාහක්,
- කිරි බඳුන් සමඟ දුහුල් වස්ත්‍රයෙන් සැරසූ දෙනුන් අසූහාරදාහක්,
- දිගු ලොම් ඇති පලස් අතුරන ලද, සුදු ඇතිරිලි අතුරන ලද, ඝන පුළුන් සහිත එළු ලොම් අතුරන ලද, කෙසෙල් මුවන්ගේ (මුව කුලයේ සත්ව විශේෂයක්) සමින් කළ ඇතිරිලි අතුරන ලද, උඩු වියන් සහිත දෙපසින් රතු කොට්ට තැබූ යහන් අසූහාරදහසක්,
- ඉතා සිනිඳු වස්ත්‍ර, සිනිඳු කසී සළු, සිනිඳු කම්බිලි, සිනිඳු කපු වස්ත්‍ර යන මේවායින් කෝටි අසූහාරදාහක්,
- ආහාර පාන, කන බොන දේ ගැන කියනු කවරේද? ගඟක් මෙන් ගලයි.

ගෘහපතිය, ඒ වේලාම බමුණා වෙන කෙනෙකු යැයි ඔබට සිතීමට පුළුවන. එය එසේ නොවෙයි. එකල මම වේලාම බමුණා වී ඒ ‘මහා දානය’ දුනිමි. එහෙත් ඒ දක්ෂිණාව (දානය) පිරිසිදු කිරීමට ප්‍රතිග්‍රාහකයෙක් (සුදුස්සෙක්) එකල නොවීය. කිසිවෙක් ඒ දක්ෂිණාව පිරිසිදු නොකළෝය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, එයට වඩා යමෙක් සෝවාන් පුද්ගලයෙකු වළඳවා නම් එය අතිශයින් මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් සෝතාපන්නයන් සියයක් වළඳවා ද, එයට වඩා යමෙක් සකදාගාමි පුද්ගලයෙකු වළඳවන්නේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් සකදාගාමීන් සියයක් වළඳවා ද, එයට වඩා එක් අනාගාමි පුද්ගලයෙක් වළඳවන්නේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් අනාගාමීන් සියයක් වළඳවා ද, එයට වඩා එක් රහතන් වහන්සේ නමක් වළඳවන්නේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් රහතන් වහන්සේලා සිය නමක් වළඳවා ද, එයට වඩා එක් පසේ බුදුවරයෙක් වළඳවා නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් පසේ බුදුවරුන් සිය නමක් වළඳවා ද, එයට වඩා එක් සම්මා සම්බුදුවරයෙක් වළඳවන්නේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් සම්මා සම්බුදුවරයෙක් වළඳවා ද, එයට වඩා බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය වළඳවන්නේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය වළඳවා ද, එයට වඩා සතර දිගින් වඩිනා මහා සංඝ රත්නය උදෙසා විහාරයක් (කුටියක්, වාසාගාරයක්) කරවයි නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් සතර දිගින් වඩිනා මහා සංඝ රත්නය උදෙසා විහාරයක් කරවයි ද, එයට වඩා කරුණු දැන පැහැදීමෙන් යුතු ව තුනුරුවන් (බුදුන්, දහම්, සඟුන්) සරණ යයි නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, එසේ තුනුරුවන් සරණ යාමට වඩා කරුණු දැන පැහැදීමෙන් යුතු ව පන්සිල් සමාදන් වී (සතුන් මැරීමෙන් වැළකී, හොරකමින් වැළකී, කාමය වරදවා හැසිරීමෙන් වැළකී, බොරු කීමෙන් වැළකී හා මද පමා දෙකට කරුණු වූ රහමෙර බීමෙන් වැළකී) වෙසේ නම් එය මහත්ඵල වන්නේය.

ඒ වේලාම බමුණා ‘මහා දානය’ නම් වූ යම් දානයක් දුන්නේ ද, යමෙක් කරුණු දැන පැහැදීමෙන් යුතු ව පන්සිල් සමාදන් වීමට වඩා සුවඳක් සිඹිනා තරම් කාලයක් මෙත් සිත වඩා නම් එය මහත්ඵල වෙයි.

ගෘහපතිය, වේලාම බමුණා 'මහා දානය' නම් වූ යම් දානයක් දුන්නේ ද, එයට වඩා යමෙක් දිට්ඨි සම්පන්නයෙකු වළඳවා නම්,

යමෙක් දිට්ඨි සම්පන්නයන් සියයක් වළඳවා ද, එයට වඩා එක් සකදාගාමියකු වළඳවා නම්,

යමෙක් සකදාගාමීන් සියයක් වළඳවනවාට වඩා එක් අනාගාමියකු වළඳවා නම්,

යමෙක් අනාගාමීන් සියයක් වළඳවනවාට වඩා එක් රහතන් වහන්සේ නමක් වළඳවා නම්,

යමෙක් රහතන් වහන්සේලා සිය නමක් වළඳවනවාට වඩා එක් පසේ බුදුවරයෙක් වළඳවා නම්,

යමෙක් පසේ බුදුවරුන් සිය නමක් වළඳවනවාට වඩා එක් සම්මා සම්බුදුවරයෙක් වළඳවා නම්,

යමෙක් සම්මා සම්බුදුවරයෙක් වළඳවනවාට වඩා බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය වළඳවා නම්,

යමෙක් බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය වළඳවනවාට වඩා සතර දිගින් වඩිනා මහා සංඝ රත්නය උදෙසා විහාරයක් කරවා නම්,

යමෙක් සතර දිගින් වඩිනා මහා සංඝ රත්නය උදෙසා විහාරයක් කරවනවාට වඩා, කරුණු දැන පැහැදීමෙන් යුතු ව තුනුරුවන් සරණ යා නම්,

යමෙක් කරුණු දැන පැහැදීමෙන් යුතු ව තුනුරුවන් සරණ යාමට වඩා කරුණු දැන පැහැදීමෙන් යුතු ව පංච සීලය සමාදන් වේ නම්,

යමෙක් කරුණු දැන පැහැදීමෙන් යුතු ව පංච සීලය සමාදන් වීමට වඩා සුවඳක් සිඹිනා තරම් කාලයක් මෙත් සිත වඩා නම්,

යමෙක් සුවඳක් සිඹිනා තරම් කාලයක් මෙත් සිත වැඩීමට වඩා අසුරු සැණක් ගසන පමණ කාලයක් අනිත්‍යය වඩා නම් එය මහත්ඵල මහානිසංස වෙයි".